මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව
--------------------------------
පොළොන්නරුව දිස්ත්‍රික්කය
---------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය

(අ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසයට අදාල රු. 934,624 ක් හා දෙසැම්බර් මාසයට අදාල උසාවි දඩ ආදායම හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 901,704 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දෙවන ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත රු. 2,560,241 ගෙවිය යුතුව තිබුණි. මෙම මුදල සභාව වෙතින් නිරවුල් කළ යුතු මුදලක් හා සභාව වෙත අමාත්‍යාංශයෙන් අයවිය යුතුව තිබූ මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට අතැති තොග වශයෙන් පෙන්විය යුතුව තිබූ ඉන්ධන හා පාරිභෝගික ද්‍රව්‍යවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන ව්‍යාපෘතියට සභාව සතු යන්ත්‍රෝපකරණ වල සේවය ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට අයවිය යුතුව තිබූ රු. 504,700 ක මුදල මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක ඇප තැන්පත් උපලේඛන අනුව ඇප තැන්පත් වටිනාකම රු. 127,639 ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශන අනුව එම අගය රු. 81,835 ක් වූයෙන් රු. 45,804 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ස්ථාවර වත්කම් වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය අතර 2017 දෙසැම්බර් 31 දිනට රු. 312,988 ක වෙනසක් පැවතුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පත් උපලේඛනය අනුව වටිනාකම රු. 548,193 ක් වූ අතර මූලා ප්‍රකාශන අනුව එහි අගය රු. 619,930 ක් වූයෙන් රු. 71,737 ක වෙනසක් පැවතුණි.

(ඈ) වියදම් ණයහිමි ශේෂය හා එයට අදාල කල වැඩ වාර්තාව අතර රු. 1,612,785 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම් ශේෂ තුල වූ 1997-2013 ත් අතර කාලය තුල පැන නැඟී තිබූ හිඟආදායම් රු. 155,344 ක ශේෂ 17 ක් සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගේ 1988 අප්‍රේල් 20 දිනැති අංක 88/20 දරන පළාත් පාලන ආයතන වල අයකරගත නොහැකි මුදල් සම්බන්ධ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ ව්‍යාපෘති සඳහා 2010 වර්ෂයේ සිට 2015 දක්වා අත රඳවාගෙන තිබුණු කර්මාන්ත තැන්පත් රු. 2,811,892 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
--------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 202,244,442 ක් වූ ගිණුම් විෂයය 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------

නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| | රු. | |
| (අ) 1987 අංක 15 දරනප්‍රාදේශීය සභා පනත | | |
| (i) 126 (XXX) වගන්තිය | | ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම හා පාලනය කිරීම හා ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. |
| (ii) 143 වගන්තිය | | සභා බල ප්‍රදේශයේ වූ ඉඩම් හා ගොඩනැඟිලි වල වර්ෂ 04 ක කාලයක සිට සිදුකරන ලද සංවර්ධන කටයුතු වලට අදාලව තක්සේරුවක් සිදුකර නොතිබුණි. |
| (iii) 147 හා 149 වගන්තිය | | ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ බොහෝ ව්‍යාපාරික ස්ථාන වලින් බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 150(1),152(1) හා 153(1) වගන්ති | | කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සහ සංවර්ධනය නොකරන ලද ඉඩම් පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (v) | 152 (2) වගන්ති | | වෘත්තිකයන්ගෙන් බදු අයකර ගැනීමට අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) | | |
| (i) | රීති අංක 59 සිට 63 දක්වා | | සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තු මාර්තු 31 දින වන විට පිළියෙල කර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | රීති අංක 203,204 හා 218 | | සභාවේ දේපල සම්බන්ධ පූර්ණ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 වැනි රෙගුලාසිය | 3,939,000 | අන්තර් ගම්මාන ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද පාලමක් කඩා වැටීම සම්බන්ධව හානි හා පාඩු වාර්තා පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| | 2.11.2 මාර්ගෝපදේශය | | ප්‍රසම්පාදන කමිටු සඳහා සාමාජිකයින්ගේ පැමිණීමේ ලේඛනයක් කමිටුවේ ලේකම්වරයා විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 6,027,436 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 10,152,038 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,622,000 | 2,945,701 | 2,040,870 | 3,112,673 | 2,389,400 | 4,546,412 | 2,040,870 | 2,761,130 |
| (ii) | කුලී | 7,551,000 | 4,406,500 | 4,127,027 | 194,249 | 9,167,000 | 2,272,338 | 4,127,027 | 208,966 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 465,000 | 152,979 | 564,070 | - | 410,000 | 564,070 | 564,070 | - |
| (iv) | වෙනත් ආදායම් | 38,883,500 | 32,634,907 | 22,643,712 | 20,910,542 | 45,809,000 | 36,522,303 | 22,623,796 | 42,299,184 |
| | | 49,521,500 | 40,140,087 | 29,375,679 | 24,217,464 | 57,775,400 | 43,905,123 | 29,355,763 | 45,269,280 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් රු. 49,521,500 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද රැස්කර තිබූ ආදායම රු. 29,375,679 ක් විය. එය ප්‍රතිශතයක් ලෙස ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 59 ක් වූ පහළ මට්ටමක පැවතුණි.

### 2.2.3 වරිපනම් හා බදු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට අදාලව රැස්කරන ලද හිඟ වරිපනම් ආදායම රු. 377,319 ක් වූ අතර එය අය කරගත යුතුව තිබූ රු. 2,761,130 ක හිඟ වරිපනම් ආදායමෙන් සියයට 13 ක් පමණක් විය. මේ අනුව හිඟ ආදායම් රැස්කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය අනුව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේදී කර්මාන්ත බදු රු. 15,000 ක් අයකළ ආයතන 12 කින් සමාලෝචිත වර්ෂයට කර්මාන්ත බදු අයකර නොතිබුණි.

### 2.2.4 බලපත්‍ර ගාස්තු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මැදිරිගිරිය නගරයේ වෙළඳසැල් 20 ක නියැදියකට අදාලව 2017 වර්ෂයේ වෙලඳ බලපත්‍ර ගාස්තු අයකිරීම සම්බන්ධව පරීක්ෂා කිරීමේදී වෙළඳසැල් 15 කින් එනම් සියයට 75 කින් බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

(ආ) මැදිරිගිරිය නගරයෙන් බැහැර ක්ෂේත්‍රයේ වෙළඳසැල් 04 ක් සම්බන්ධව බලපත්‍ර ගාස්තු අයකිරීම් පරික්ෂාවේදී එම වෙළඳසැල් 04 සඳහාම 2017 වර්ෂයේ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

### 2.2.5 වෙනත් ආදායම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකර ගැනීම විධිමත් පරිදි සිදුකර නොතිබීම හේතුවෙන් සභාව වෙත විශාල දැන්වීම් පුවරු ආදායමක් අහිමි වී තිබුණි. විගණනය විසින් නගරයෙන් බැහැර කිලෝමීටර් 07 ක

පමණ ප්‍රදේශයක් සම්බන්ධව සිදුකළ පරීක්ෂණයකදී අනාවරණය වූ පරිදි විවිධ ආයතන වෙතින් රු. 64,325 ක් හා දුරකථන ආයතනයකින් රු. 80,000 ක දැන්වීම් පුවරු ආදායම අයකරගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට හිටපු මන්ත්‍රීවරුන් 04 දෙනෙකුගෙන් අයකරගත යුතුව තිබූ යන්ත්‍ර සූත්‍ර කුලී ආදායම් රු. 342,180 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම්

----------------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුඋසාවි දඩ රු. 1,711,013 ක් හා මුද්දර ගාස්තු රු. 9,683,039 ක් විය.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------**

3.1 කාර්ය සාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතු තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 52 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 42 වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාත්මක නොකල කර්තව්‍යයන්

-------------------------------------

2017 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා පරිපාලන කමිටුව විසින් යෝජනා කරන ලද රු. 3,899,091 ක් වූ යෝජනා 03 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) දියසෙන්පුර පරණ මස් කඩ කාමරය වැසිකිලියද සමඟ අලුත්වැඩියා කිරීම සඳහා රු. 12,520,292 ක ප්‍රතිපාදන ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ 2017 නොවැම්බර් 06 දින ලබාදී තිබුණි. නමුත් අදාල ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දියසෙන්පුර කඩ කාමර 03 ක ප්‍රමාණවත් පහසුකම් නොතිබීම නිසා ගැණුම්කරුවන් ඉදිරිපත් වී නොතිබුණි.

(ආ) 2017 පළාත් සභා විමධ්‍යගත සංවර්ධන වැඩසටහන යටතේ පෞද්ගලික පාර්ශවයන් වෙත රු. 450,000 ක් වටිනාකම වූ විවිධ උපකරණ හා ආධාර ලබාදී තිබුණි. මෙම උපකරණ ලබාදීම සඳහා එම පාර්ශවයන් තෝරාගත් පදනම, ග්‍රාම නිලධාරී වාර්තා හා බෙදාහරින ලද උපකරණ අදාල අරමුණු සඳහා යෙදවූයේද යන්න පසුවිපරම් කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------

සේවක පුරප්පාඩු

--------------------

2017 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුර, සංවර්ධන නිලධාරී තනතුරු 03 ක් හා කාර්මික නිලධාරී තනතුර පුරප්පාඩු වී පැවතුණි.

3. 4 මතභේදයට තුඩුදුන් ගණුදෙණු

-----------------------------------

පළාත් සභා සංවර්ධන වැඩසටහන යටතේ පෞද්ගලික පාර්ශවයක් වෙත මල් පෝච්චි නිෂ්පාදනය සඳහා රු. 50,000 ක් වටිනා භාණ්ඩ ලබාදී තිබුණු නමුත් අදාල භාණ්ඩ උපයෝගී කරගෙන මල් පෝච්චි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

3.5.1 පවරා නොගත් වත්කම්

---------------------------

සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වශයෙන් සැලකිය යුතු, පිළිසරු සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය හා එම ඉඩම, පුස්තකාල 03 හා ඒවා පිහිටි ඉඩම්, පොදු ක්‍රීඩා පිටි 35 ක් පිහිටි ඉඩම්, සුසාන භූමි 32 ක් පිහිටි ඉඩම්, ආයුර්වේදය හා එම ඉඩම සභාව නමින් පවරාගෙන වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

-------------------------------------------

සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබෙන නල ළිං සංඛ්‍යාව 323 ක් වූ අතර ඒවා ඉදිකළ දින සිට පිරිසිදු කිරීම හෝ අලුත්වැඩියා නොකිරීම නිසා භාවිතයට ගත නොහැකි නල ළිං සංඛ්‍යාව 120 ක් විය.

3.5.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------------

සභාවට අයත් වටිනාකම රු. 2,214,000 ක් වූ වත්කම් අයිතම් 04 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි අයිතම් 02 ක් වසර 02 ත් 10 ත් අතර කාලයක සිට නිශ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

3.6 ප්‍රසම්පාදනය

---------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

ප්‍රාදේශිය සභාව විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**04. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**-------------------------------------**

4.1 අභ්‍යන්තර විගණනය

----------------------

සමාලෝචිත වර්ෂයේ දී සභාවේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

4.2. විගණන හා කළමනාකරණ කමිටු
-----------------------------------------

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ 2016 මැයි 11 දිනැති අංක එන්සීපී/සීඑස්/01 විගණන දරන ලිපිය මඟින් විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස 02 කට වරක්ම පැවැත්විය යුතු බව දක්වා ඇතත් 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**05. පද්ධති හා පාලන**
**-----------------**

විගණනයේදී නිරීක්ෂණය වු අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | වත්කම් ඌණ උපයෝජිතව පැවැතීම |
| | | (ii) | වත්කම් තක්සේරු කර දක්වා නොතිබීම |
| | | (iii) | වත්කම්වල ආරක්ෂාව තහවුරු නොවීම |
| (ආ) | ගිණුම්කරණය | (i) | ආදායම් රැස්කිරීම හා හිඟ ආදායම් ගිණුම්ගත කර නොතිබීම |
| | | (ii) | ප්‍රා.ස 12 වැය ලේඛනය නිසිපරිදි සම්පූර්ණ කර නොතිබීම |
| | | (iii) | වරිපනම් ලේඛන තුලනය කර නොතිබීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | | හිඟ ආදායම් අය නොකිරීම |
| (ඈ) | ණයගැති/ණයහිමි පාලනය | | ණයගැතියන් හා ණයහිමියන් නිරවුල් නොකිරීම |
| (ඉ) | වාහන පාලනය | (i) | ඉන්ධන පරීක්ෂා සිදු නොකිරීම |
| | | (ii) | අවශ්‍ය තොරතුරු ලබාගත හැකි පරිදි වාහන ආදායම් ලේඛන නොපැවැත්වීම |
| | | (iii) | ලොග් පොත් සටහන් සම්පූර්ණ නොකිරීම |